7A

විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : " ஓய்வூதியம் " கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No.: විවැ චක්‍රලේඛ/2006

ඔබේ අංකය / உமது இல. / Your No.:

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2006.10.24

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2006 (තොරතුරු සොයාගත නොහැකි ලිපිගොනු)**

සියලුම දිසා ලේකම්වරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම - 2006**

මවිසින් නිකුත් කරන ලද 2/2006 හා ඊට අනුකූලව නිකුත් කරන ලද සියලු චක්‍රලේඛ හා බැඳේ.

විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේදී ඇතැම් ලිපිගොනු සම්බන්ධයෙන් තොරතුරු නොමැතිකම නිසා කටයුතු කිරීමේ අපහසුතාවය ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මා වෙත දන්වා ඇත. විශේෂයෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් විෂමතාවය සැකසීමේදී මුල් විශ්‍රාම වැටුප් ලිපිගොනු නොමැතිකමින් කඩිනමින් කටයුතු කිරීමේ අපහසුතාවය මා වෙත වාර්තා වී ඇත. එවැනි ලිපිගොනු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2006 විෂමතා ඉවත් කිරීම සඳහා පහත සඳහන් උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීම අනුමත කරමි.

1. තොරතුරු නොමැති ලිපිගොනු සම්බන්ධයෙන් සේවා කාලය අවුරුදු 25 ක් ලෙස සැලකිය යුතු අතර වැටුප් රහිත නිවාඩු නොමැති සේ සැලකිය යුතුය.
2. 1997.01.01 දිනට පරිවර්තිත වැටුප රු.51,840/- ක් වශයෙන් සැලකිය යුතුය.
3. මෙම පදනම මත විෂමතා ඉවත් කල හැක්කේ 1997.01.01 දින පදනම් කර ගෙන පමණි.
4. මෙම උපදෙස්වලට අනුව විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කල පසුව තොරතුරු අනාවරණය වීම මත යලි සංශෝධනයක් කල යුතුය.

2006.12.31 දින වනවිට විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ වැඩසටහන අවසන් කල යුතු බැවින් ඔබගේ කඩිනම් අවධානය යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

ලේකම්: 1 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2 ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

D:\Documents and Settings\Administrator\My Documents\Inoka\2006.10.23.doc